# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ චරිතය

### 03 වන පාඩම; බුද්ධ කාලීන භාරතීය ආර්ථික පසුබිම

[[ 2024/2025 ]] 02 වන පාඩම

I බුද්ධ කාලීන භාරතීය ආර්ථික ක්‍රියාවලිය සාකච්ඡා කළ හැකි ප්‍රධාන සිරස්තල හතරක් දක්වන්න.
II බුද්ධ කාලීන භාරතයේ පැවති අතුරු භෝග වගාවන් හතරක් නම් කරන්න.
III බුද්ධ කාලීන භාරතය තුළ ගව පාලනය දියුණු ආර්ථික සාධකයක්වූ බවට කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.
IV ශ්‍රී ලංකාවේ ආර්ථික සමෘද්ධිය ඇති කිරීමෙහිලා භාරතීය අර්ථ ක්‍රමයෙන් ගත හැකි ආදර්ශ සාකච්ඡා කරන්න.

[[ 2020/2021/2022/2023 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ ආර්ථික ක්‍රියාවලිය තුළ පැවති නිෂ්පාදන කර්මාන්ත හතරක් නම් කරන්න.
II එවක ශාක්‍ය වංශික රජවරුන් කෘෂිකර්මාන්තය සමග පැවති සබඳතාව ප්‍රකට කරලීමට බෞද්ධ සාහිත්‍යගත උදාහරණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
III පැරණි භාරතීය සමාජය තුළ දියුණු වෙළඳ ආර්ථිකයක් පැවති බවට සාධක දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.
IV බුද්ධකාලීන භාරතයේ ආර්ථික සමෘද්ධිය උදෙසා අනුගමණය කළැයි සැළකෙන ආර්ථික උපාය මාර්ග විචාරයට ලක් කරන්න.

[[ 2016/2017 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති ආර්ථික නිෂ්පාදන හතරක් නම් කරන්න.
II බුදුන් වහන්සේ ජීවමාන සමයෙහි පැවති බොහෝ ශිල්ප කර්මාන්ත සඳහා වෙන් වූ ශිල්ප ශ්‍රේණි දහාටක් වූ බව සඳහන් වේ.එයින් හතරක් ලියන්න.
III පූරතන භාරතයේ ආර්ථික ක්‍රමයේ පදනම වූයේ සාම්ප්‍රධායික කෘෂිකර්මික ක්‍රියාවලියයි. මේ බව බෞද්ධ සාහිත්‍යයේ තොරතුරු ඇසුරින් කෙටියෙන් විමසන්න.
IV වර්ථමාන ශ්‍රී ලංකාව තුළ ආර්ථික සමෘද්ධියක් ඇති කිරිමෙහිලා ඉපැරණි භාරතීය ආර්ථික ක්‍රමෝපායයන්ගෙන් ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න.

[[ 2014/2015 ]] 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ ආර්ථික ක්‍රියාවලියට අදාළ ජීවිකා වෘත්තීන් හතරක් නම් කරන්න.
II පුරතන භාරතයේ ආර්ථික ක්‍රම කෘෂිකර්මාන්තය මත පදනම්ව පැවති බවට සාධක කෙටියෙන් පෙන්වා දෙන්න.
III "බුද්ධ කාලීන භාරතයේ දියුණු වෙළඳ නගර පැවතීම තුළින් උසස් වෙළඳ ආර්ථික රටාවක තත්ත්වය පෙන්නුම් කරයි." විමසන්න.
IV බුද්ධ කාලීන භාරතයේ පැවති ආර්ථික ක්‍රමෝපායයන් අතරින් රටක සංවර්ධනය උදෙසා නූතනයේ අනුගමනය කළ හැකි ආර්ථික ප්‍රතිපත්ති කවරේදැයි දක්වන්න.

[[ 2009/2010 ]] 03 වන ප්‍රශ්නය

I කසීභාරද්වාජ,ධනිය,ජීවක,අම්බපාලී කවර වෘත්තිකයන්දැයි පිළිවෙළින් දක්වන්න.
II ශාක්‍යයන්ගේ ආර්ථික කටයුතුවල කෘෂි කර්මාන්තයට වැදගත් තැනක් හිමිව තිබූ බවට දැක්විය හැකි සාධක දෙකක් නම් කරන්න.
III භාරතීය ආර්ථිකයට විවිධ ශිල්පීන්ගෙන් ලැබුණු දායකත්වය කෙබඳු දැයි පැහැදිලි කරන්න.
IV "කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය,ධීවර කර්මාන්තය මූලොක කරගත් ආර්ථික ක්‍රියාවලියක් බුද්ධකාලීන භාරතයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට උපකාර විය." යන කියමන පරීක්ෂාවට ලක් කරන්න.

[[ 2007/2008 ]] 02 වන ප්‍රශ්නය

I –
II –
III බුද්ධ කාලීන භාරතයේ දේශීය හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ විස්තරයක් කරන්න.
IV –

[[[ 2004 ]] 03 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතීය ආර්ථික ක්‍රමය සැකෙවින් හඳුන්වන්න.
II එකී ආර්ථික ක්‍රමය ආශ්‍රයෙන් කෘෂිකාර්මික ආර්ථිකයක නොතිබිය යුතු ලක්ෂණ පෙන්වා දෙන්න.

[[[ 1999 ]]] 01 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන භාරතයේ පැවති රැකියා පහක් නම් කර්න්න.
II කුලය හා රැකියාව අතර පැවති සම්බන්ධය පැහැදිලි කරන්න.

[[[  1996  ]]]        02 වන ප්‍රශ්නය

පැරණි භාරතීය අර්ථ ක්‍රමයෙහි ප්‍රධාන ස්ථානය හිමිව ඇත්තේ සාම්ප්‍රදායික  කෘෂිකාර්මික ක්‍රියාවලියට බව පැහැදිලි කරන්න.

විල්වල ස්කෝලේ හාමුදුරුවෝ